## සිංහල අවුරුද්දේ

ශ්‍රී ලංකා ජර්මන් කාර්මික අභයාස ආයතනීය ආදි ශිෂ්‍ය සංගමය මෙහෙයවූ මෙල්බන් නුවර සිංහල අවුරුදු උළෙලේ අවස්ථා කීපයක් සන්නස කැමරාවට හසුවුණ අයුරුයි මේ

සේයාරූ ප්‍රියන්ත පෙරේරා













බලංගොඩ කිට්ටුව වලව්වක කුමාරිහාමි කෙනෙක් අප්පොත් එක්ක තරහ වෙලා තමන්ගෙ දෙමව්පියන් ළඟට ගියා. මේ වලව්වෙ කුමාරි නමින් ඇතින්නක් හිටිය. ඇය පුරුද්දක් හැටියට හැමදාම උදේට වලව්වෙ දොරකඩට එනව. එනකොට වළව්වේ අප්පො ඇයට කෙසෙල් ඇවරියක්, උක්ගහක් වගේ රස පළතුරක් දෙනවා. ඇය මේකත් අරන් සන්තෝසෙන් තමන්ගෙ රාජකාරිවලට යනව. එදත් කුමාරි වළව්වෙ දොරකඩට ආව. වෙනදට පළතුරුත් අරන් කුමාරි ළඟට එන අප්පො කම්මුලට අත තියාගෙන හාන්සි පුටුවෙ දිගැදිල ඉන්නව. අප්පො කිව්ව 'අද නම් පළතුරු නෑ කුමාරි. කුමාරිහාමිත් තරහ වෙලා අම්මලගෙ ගෙදර ගියා'

මේක ඇහුණ ගමන් කුමාරි ආපහු හැරුණ. ගොච්වට ඇව නවත්වන්න හැකියාවක් ලැබුණේ නැහැ. පාරට වැටුණු කුමාරි කඩිමුඩියෙම ගිහින් නැවතුණේ හැතැප්ම හත අටක් එහායින් තිබුණු කුමාරි හාමිලගෙ වළව්වෙ මිදුලෙ.

'ආ... මේ මොකද කුමාරි?' කුමාරි දැක්ක හැටියෙ කුමාරිහාමි පුදුම වුණා. ළඟට ඇවිත් ඇය පැමිණි හේතුව හොයන්න වුණා.

හොඬය දිගු කරල කුමාරිහාමිව උස්ස ගත්තු කුමාරි ආපහු හැරුණ. බියට පත්වුණු කුමාරිහාමි පළාතම දෙවනත් වෙන්න කෑ ගැහුවා. මේ වැඩේ දැකපු අය ඊටත් වඩා බයවුණා. ඒත් කවුරුවත් කුමාරිගෙ වැඩේ නතර කරන්න තරම් එඩිතර වුණේ නැහැ. කුමාරිහාමිව සීරුවෙන්, නොරිදෙන විදිහට හොඬයට හිර කර ගත්තු කුමාරි ආපු පාර දිගේම ආපහු ගිහින් නැවතුණේ තමන්ට සුපුරුදු වළව්වෙ මිදුලෙ. වළව්වෙ ඉස්තෝප්පුවට වෙලා හිටපු අප්පොගෙ මෙහා පැත්තෙන් කුමාරිහාමිව තියපු කුමාරි බොහොම කීකරු විදිහට ආයෙත් තමන්ගෙ දම්වැල් කණුව ළඟට ගියා.

ගල්පොකුණ වත්ත, අක්කර තුන්දහක විතර විශාලත්වයකින් යුත් පොල් වත්තක්. සෙනඟ පන්සීයක් විතර මේ වත්තෙ සේවය කළා. 'විජය' මේ වත්තෙ හිටපු අලියෙක්. විජයත් අර සෙනඟ එක්ක හරි හරියට පොල් වත්තෙ වැඩ කළා. උදේ අටට මණිය ගහපුවහම වත්තෙ වැඩ පටන් ගන්නව. දොළහට නවත්තල ආයෙත් එකට පටන් ගන්නවා. හැන්දෑවෙ පහට මණිය ගහපුවහම දවසෙ වැඩ නවත්තනව.

සාමාන්‍ය ක්‍රමය මෙහෙම වුණාට වැඩිපුර වැඩ තිබුණොත් පහමාර හය වෙනකම් වැඩ කරන්න වත්තෙ වැඩ කරන සේවකයො බැඳිල ඉන්නව. ඒවට අතිකාල දීමනා නැතත් හැමෝම වැඩ කරන්න පසුබට වෙන්නෙ නැහැ. එහෙත් කිසිම දවසක විජය නොවෙයි වෙලාවෙන් පස්සෙ කිසිම වැඩක් කරන්නෙ. පහේ මණිය ඇහුණ ගමන් හොඬයට ගත්ත පොල් ගෙඩියත් ආපහු බිමට දාල දම්වැල් කණුව ළඟට යන එකයි විජයගෙ පුරුද්ද. විජයගෙ මේ ගතිගුණ දන්න නිසා කවුරුත් ඒ ක්‍රමය වෙනස් කරන්න ගියේ නැහැ. කාලයක් යද්දි වත්තට අලුත් බාරකාරයෙක් ආව. අලුත් බාරකාරය බොහොම නපුරුයි. හැමදාම හැමෝගෙන්ම වැඩිපුර වැඩ ගන්න බලන්නෙ. විජයගෙනුත් එහෙමයි.

එදත් විජය මණියෙ හඬ අහපු ගමන්ම වැඩ නවත්තල යදම් කණුව ළඟට යන්න පිටත් වුණා. මේක දැකපු අලුත් භාරකාරය ගොච්වට කෑ ගැහුව. ඔය සතාට ඔහොම හැසිරෙන්න දෙන්න පුළුවන්ද? තව වැඩ ගන්නව තව වැඩ ගන්නව. විජයගෙ හැටි දන්න ගොච්ව අසරණ වෙලා බලා උන්න. වත්තෙ හැමෝමත් ඊළඟට වෙන දේ ගැන විමසිලිමත් වුණා. ගොච්ව කිසි දෙයක් හිතා ගන්න බැරිව ඉන්න දැකපු වත්තෙ බාරකාරය ගොච්ව ළඟට ගිහින් ආයෙත් කෑ ගහන්න ගත්ත.

'ඔය සතාවත් අරන් ගිහින් ආයෙත් වැඩ... ' බාරකාරයට කියපු දේ අවසන් කරන්න ලැබුණෙ නැහැ. විදුලි වේගයෙන් ආපහු හැරුණු විජය බාරකාරය හොඬයට හිර කර ගත්ත. වත්තෙ හැමෝම විලාප තිබ්බ.

බාරකාරයව හොඬයට අරගෙන උස්සා ගත්තු විජය වත්තෙ ගේට්ටුව දිහාවට දිව්ව. වත්තෙ ගේට්ටුවට එහා පැත්තෙන් බාරකාරයව තියපු විජය මුරකරුව තුෂ්ණිම්භූතවෙලා ඉද්දිදි වත්තෙ ගේට්ටුව වහල දැම්ම. සේවකයින්ට දැඩි හිසරදයක් වුණු වත්තෙ අලුත් පාලකයට විජය දුන්න දඬුවම ඒකයි.

**පැතුම් ගජනායක**